රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

பொது நிர்வாக, உள்நாட்டலுவல்கள், மாகாண சபை மற்றும் உள்ளூராட்சிகள் அமைச்சு

Ministry of Public Administration, Home Affairs and Provincial Councils & Local Government

ස්වදේශ කටයුතු අංශය (දිස්ත්‍රික් පාලන) | உள்நாட்டலுவல்கள் பிரிவு (மாவட்ட நிர்வாகப்) | Home Affairs Division (District Administration)


මගේ අංකය / எனது இல / My No: HA/05/03/02/24 | ඔබේ අංකය / உமது இல / Your No: | දිනය / திகதி / Date: 2019.12.19

සියළුම දිස්ත්‍රික් ලේකම්වරු සහ ප්‍රාදේශීය ලේකම්වරු වෙත

**<u>පුහුණු පාඨමාලා සඳහා සම්පත් දායකයින් ලියාපදිංචි කරගැනීම</u>**

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ප්‍රාදේශීය පුහුණු පාඨමාලා පැවැත්වීමට සම්පත් දායකයින් ලියාපදිංචි කර ගැනීම මේ වන විට ආරම්භ කර ඇත.

02.ඒ අනුව එම සම්පත් දායකයින් මගින් ප්‍රාදේශීය වශයෙන් සිදුකිරීමට යෝජිත පාඨමාලා, මාගේ අංක HA/05/03/02/24 හා 2019.12.10 දිනැති ලිපිය මගින් ඔබ වෙත දන්වන ලදි. එම සහතික පත්‍ර පාඨමාලා හා ඩිප්ලෝමා පාඨමාලාවන්ට අමතරව ඔබ කාර්යාලයේ සිදුකිරීමට අවශ්‍ය පුහුණු වැඩසටහන් ඇත්නම් එම පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර මා වෙත යොමු කරන මෙන් දන්වා සිටිමි. විශේෂයෙන්ම එම පාඨමාලා අතුරින් සම්පත් දායකයින් සම්බන්ධ කරගෙන 2020 වර්ෂය තුල පැවත්විය හැකි පාඨමාලා සංඛ්‍යාව දන්වා එවන්නේ නම් වඩාත් කෘතඥ වෙමි.

03.එමෙන්ම එම පුහුණු පාඨමාලා පැවැත්වීම සඳහා ඔබ කාර්යාලයේ කොපමණ නිලධාරින් ප්‍රමාණයකට ශාලා පහසුකම් ලබාදිය හැකි ද යන්න පිළිබඳව හා 2020 වසර තුල ශාලා ලබාදිය හැකි දින ගණන් කඩිනමින් මා වෙත දන්වන මෙන් වැඩි දුරටත් කාරුණිකව දන්වා සිටිමි.

**කේ.ජී.ධර්මතිලක**

අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු)

රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා

පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙනුවට

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிர்வாக, உள்நாட்டலுவல்கள், மாகாண சபை மற்றும் உள்ளூராட்சிகள் அமைச்சு
Ministry of Public Administration, Home Affairs and Provincial Councils & Local Government

| | | |
|---|---|---|
| ස්වදේශ කටයුතු අංශය (දිස්ත්‍රික් පාලන) | உள்நாட்டலுவல்கள் பிரிவு (மாவட்ட நிர்வாகப்) | Home Affairs Division (District Administration) |

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No } HA/05/03/02/24 | ඔබේ අංකය / உமது இல / Your No } | දිනය / திகதி / Date } 2019.12. |

**පුහුණු පාඨමාලා සඳහා සම්පත් දායකයින් ලියාපදිංචි කර ගැනීමට මිළගණන් කැඳවීම - 2020**

ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 තුළ පහත සඳහන් පුහුණු වැඩසටහන් සඳහා උතුරු නැගෙනහිර පළාත් සඳහා දෙමළ මාධ්‍ය සම්පත් දායකයින් ද, අනෙකුත් පළාත් සඳහා සිංහල මාධ්‍ය සම්පත් දායකයින් ද, ඉංග්‍රීසි භාෂා පුහුණුව සඳහා දිවයිනටමද, සම්පත් දායකයින් ලියාපදිංචි කර ගැනීමට ස්වදේශ කටයුතු අමාත්‍යාංශය තීරණය කර ඇත.

02. ඒ අනුව ඒ ඒ සම්පත් දායකයින් විසින් ඒ ඒ දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත පුහුණු වැඩ සැලැස්මක් පූර්ණකාලීනව හෝ අර්ධකාලීනව සකසා ඉදිරිපත් කළ යුතුය.විශ්‍රාමික නිලධාරින්ට ද සම්පත් දායකයින් ලෙස ලියාපදිංචි වීමට අවකාශ සැලසෙනු ඇත.

03. රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ EST/7/ALLOW/05/0107 අංක දරණ ලිපියේ සඳහන් පරිදි පුහුණු වැඩසටහන්වලට සම්පත්දායකයින් සඳහා දීමනා ගෙවනු ලබනු ඇත.(ඇමුණුම 01)

04. පහත සඳහන් ඩිප්ලෝමා පාඨමාලා දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සංවිධානය කර ඔබගේ සම්බන්ධීකරණය ඇතුව පවත්වනු ඇත.

05. මේ සමග ඉදිරිපත් කර ඇති ආකෘතියට අනුව ඔබගේ සම්පත්දායකත්වය ලබාදිය හැකි දේශන පිළිබඳව 2020 වර්ෂයට අදාලව ඔබගේ පුහුණු සැලැස්ම දිස්ත්‍රික් මට්ටමින් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සකසා ඉදිරිපත් කරන ලෙසටත් ඉහතින් සඳහන් ගෙවීම් චක්‍රලේඛය හෝ ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන මිළ ගණන් ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි. සෑම සම්පත් දායකයෙකු විසින්ම තම දේශන පවත්වන විෂය ක්ෂේත්‍රය පිළිබඳ රජයේ ලියාපදිංචි අධ්‍යාපන ආයතනයකින් උපාධියක් හෝ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබිය යුතුය. දැනටමත් අප අමාත්‍යාංශයේ සම්පත් දායකයෙකු ලෙස ලියාපදිංචි වී ඇති සම්පත්දායකයින්ටද මේ සඳහා අයදුම් කළ හැකිය.

06.එසේම මෙම පුහුණු පාඨමාලා නිලධාරින් 50 දෙනෙකුගෙන් යුත් කණ්ඩායම් වශයෙන් සති අන්ත හා සති මැද පාඨමාලා ලෙස පැවැත්වීමට සැලැස්මක් ඉදිරිපත් කළ යුතු අතර සෑම පාඨමාලාවක් අවසානයේදී විෂය ක්ෂේත්‍රයට අදාල වන පරිදි විභාග පැවැත්විය යුතු අතර එයට අදාල විභාග ප්‍රශ්ණපත්‍ර සකස්කිරීම සහ පිළිතුරු පත්‍ර පරීක්ෂා කිරීමද සිදුකළ යුතු වේ.එබැවින් එයට අදාල මිළ ගණන් ද ඉදිරිපත් කරන ලෙස ද දන්වමි.

07. තවද ඔබගේ යෝජිත මිලගණන් "පුහුණු පාඨමාලා සඳහා සම්පත් දායකයින් ලියාපදිංචිකර ගැනීම - 2020 "යනුවෙන් ලියුම් කවරයේ වම් පස ඉහල කෙලවරේ සඳහන් කර 2020.01.31 දින ප .ව .2.00 ට පෙර ලැබෙන සේ , ලේකම් , රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, නිල මැදුර, ඇල්විටිගල මාවත, කොළඹ 05 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය .


රාජ්‍ය පරිපාලන අංශය
பொது நிர்வாக பிரிவு
Public Administration Division
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.
சுதந்திர சதுக்கம், கொழும்பு 07.
Independance Square, Colombo 07.
TP : +94 112 166 000/+94 112 696 211 - 13
Fax : 94 112 695 279

ස්වදේශ කටයුතු අංශය
உள்நாட்டலுவல்கள் பிரிவு
Home Affairs Division
"නිල මැදුර", ඇල්විටිගල මාවත, කොළඹ 05.
"நில மெதுர", எல்விடிகல மாவத்தை, கொழும்பு 05.
"Nila Madura", Elvitigala Mawatha, Colombo 05.
TP : +94 115 999 639 / +94 115 305 953
Fax : +94 115 955 594

පළාත් සභා හා පළාත් පාලන අංශය
மாகாண சபை மற்றும் உள்ளூராட்சிகள் பிரிவு
Provincial Councils & Local Government Division
330, යූනියන් පෙදෙස, කොළඹ 02.
330, யூனியன் பிளேஸ்,கொழும்பு 02.
330, Union Place, Colombo 02.
TP : +94 112 305 326/7 or +94 112 303 280
Fax : +94 112 347 529

08.ඔබගේ මිළ ගණන් 2020.01.31 දින ප.ව 2.00 ට විවෘත කරන අතර ප්‍රමාද වී ලැබෙන මිළ ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.එසේම මිළ ගණන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.මේ සමග අමුණා ඇති ආකෘතිය පරිදි ඔබගේ මිළගණන් ඉදිරිපත් කළ යුතුය.

09.මේ සම්බන්ධයෙන් වැඩි විස්තර කේ.ජී.ධර්මතිලක මහතා, අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු) ඇමතීමෙන් ලබා ගත හැක. (011- 2551069 )

10.තවද, මෙම පුහුණු වැඩමුළුව සාර්ථක කර ගැනීම සඳහා ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

<u>විෂය ක්ෂේත්‍රය</u>

**01.විනය කාර්ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව -පැය** 120

- විනය ක්‍රියාවලිය
- විනය බලතල පැවරීම හා ආචාරධර්ම
- මූලික විමර්ශන, චෝදනා පත්‍ර සැකසීම හා විධිමත් විනය පරීක්ෂණ ක්‍රියාවලිය
- පැමිණිල්ල මෙහෙයවීම
- විත්තියේ රැකවරණ ක්‍රියාවලිය
- සාක්ෂි සම්පිණ්ඩනය, විනය නියෝග හා අභියාචනා ක්‍රියාවලි
- පරීක්ෂණ නිලධාරී වාර්තාව සැකසීම
- විනිශ්චය සභා ව්‍යුහය

**02.ප්‍රසම්පාදනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව-පැය** 120

- ප්‍රසම්පාදනය අර්ථ දැක්වීම
- පූර්ව ප්‍රසම්පාදන අවශ්‍යතා
- තාක්ෂණික ඇගයීම් කමිටුව
- රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා ක්‍රමවේද
- ප්‍රසම්පාදනයට අදාළ නීති රීති හා රෙගුලාසි
- ප්‍රසම්පාදන කමිටු වල ව්‍යුහය හා සීමාවන්
- ප්‍රසම්පාදන ලියවිලි සැකසීම හා ඇගයීම
- ප්‍රසම්පාදන අභියාචනා ක්‍රියාවලිය

**03. තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව-පැය** 120

- මූලික පරිගණක දැනීම
- දෘඩාංග පිළිබඳ මූලික දැනුම
- MS Office Package (including MS Access)
- MS Project
- Networking / Internet & E mail

**04. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - පැය 120**

- ලිවීම
- කියවීම
- සවන්දීම හා කථනය
- ව්‍යාකරණ
- විෂයානුබද්ධ ක්‍රියාකාරකම්

**05. පරිපාලන ග්‍රාම නිලධාරි පුහුණු සහතිකපත්‍ර පාඨමාලාව - පැය 60**

- පරිපාලකයෙකු ලෙස පරිපාලන ග්‍රාම නිලධාරිවරයෙකුගේ කාර්යය භාර්යය
- නායකත්වය
- ගැටුම් කළමනාකරණය
- ධනාත්මක ආකල්ප සංවර්ධනය
- මූලික කාර්යාල කටයුතු
- රාජ්‍ය සේවය තුළ විනය කළමනාකරණය
- වාර්තා ලිවීම
- ඉසව් සංවිධානය
- සිද්ධි අධ්‍යනය හා ඉදිරිපත්කිරීම

**06. ග්‍රාම නිලධාරි පුහුණු සහතිකපත්‍ර පාඨමාලාව - පැය 60**

- ව්‍යවස්ථාපිත රාජකාරී පිළිබඳ ග්‍රාම නිලධාරීන්ගේ පවතින දැනුම වැඩි දියුණු කිරීම.
- අධිකරණ හා පොලිස් රාජකාරී පිළිබඳව පුහුණුව
- කාර්යාල කළමනාකරණය
- යහපත් මහජන සේවයක් ඉටු කිරීම සඳහා අවශ්‍ය ආකල්ප වැඩි දියුණු කිරීම.
- සන්නිවේදනය
- නායකත්වය
- ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ හැඳින්වීම, ව්‍යාපෘති ලේඛණ පරිහරණය හා ව්‍යාපෘති සංනිවේදනය
- අනෙකුත් රේඛීය අමාතංශ වලට අදාල නිලධාරීන් සම්බන්ධීකරණය කරමින් කටයුතු කිරීම

**07.කාර්යාල කළමනාකරණ සහතිකපත්‍ර පාඨමාලාව- පැය 60**

- කාර්යාල කළමනාකරණය හැඳින්වීම
- කාර්යාල කළමනාකරණ ක්‍රම
- කාර්යාල ක්‍රම පිළිබඳ මූල ධර්ම
- විධිමත් කාර්යාල ක්‍රමයක මූලික ගුණාංග
- ලිපිගොනු කරනය හා ලිපිගොනු කරනයේ පරමාර්ථ
- ලිපිගොනු වර්ග සහ ලිපිගොනු කරනය කිරීමේ ක්‍රම
- සංවිධාන ව්‍යුහ සහ රාජකාරි ආචාර ධර්ම හා රාජ්‍ය සේවක කාර්යභාරය
- යහපත් මහජන සම්බන්ධතා සහ අන්තර් පුද්ගල සම්බන්ධතා
- සන්නිවේදන කුසලතා වර්ධනය
- ඵලදායිතා වර්ධන ක්‍රම
- ආකෘති පත්‍ර පාලනය, ආකෘති පත්‍ර සැලසුම් කිරීම හා සම්පාදනය
- ශාඛා ප්‍රධානියාගේ රාජකාරි සහ වගකීම්

**<u>තොරතුරු ලබාදිය යුතු ආකෘතිය</u>**

| අනු අංකය | සම්පත් දායකයාගේ නම | දේශන මාතෘකා | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | පැයකට අය කරන ගාස්තුව |
|---|---|---|---|---|---|
| | | | | | |

**එස්.හෙට්ටිආරච්චි**
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත් :-01. සියළුම ප්‍රධාන ලේකම්වරු -සම්පත් දායකයින් යොමු කිරීම පිණිස
02.සියළුම දිස්ත්‍රික් ලේකම්වරු -සම්පත් දායකයින් යොමු කිරීම පිණිස
03.ප්‍රධාන ගණකාධිකාරී , ස්වදේශ කටයුතු අංශය -මිල ගණන් විවෘත කිරීමේ කමිටුව දැනුවත් කිරීම පිණිස
04.සභාපති, මිල ගණන් විවෘත කිරීමේ කමිටුව (IV) -නියමිත දිනට මිල ගණන් විවෘත කිරීම සඳහා

(ඇමුණුම 01)

... நிருவாக மற்றும் அனர்த்த முகாமைத்துவ அமை...
...ry of Public Administration & Disaster Management

... අංශය
... ப் பிரிவு
...ablishments Division
... 07. சுதந்திர சதுக்கம், கொழும்பு 07. Independence Square, Colombo 07.

...-13 | ෆැක්ස් பெக்ஸ் :011-2692158 Fax | ඊ-මේල් ஈ-மெயில் :dge@pubad.gov.lk E-mail | වෙබ් අඩවිය இணையதளம் :www. pubad.gov.lk Website

EST/7/ALLOW/05/0107 | ඔබේ අංකය உமது இல : Your No } HADM/Resources | දිනය Date 2019.02. 07

... ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

**... ආයතනවල සම්පත්දායක දීමනා ගෙවීම සම්බන්ධවයි**

... හා 2019.01.25 දිනැති ලිපිය හා සම්බන්ධ වේ.

... වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය ද සැලකිල්ලට ගෙන, පුහුණු ... සඳහා සහභාගී වන බාහිර සම්පත්දායකයින්ට වගු අංක I හි සඳහන් දීමනා, පහත සඳහන් ...විලට යටත්ව ගෙවීම අනුමත කරමි.

...I

| | තනතුර | අනුමත දීමනාව (පැයකට) |
|---|---|---|
| | පිළිගත් විශ්වවිද්‍යාලයක ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්/ මහාචාර්යවරුන්<br>ශ්‍රී ලංකා පරිපාලන සේවය හා සමාන්තර දීප ව්‍යාප්ත සේවාවල විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් | රු.1200/- |
| 02. | පිළිගත් විශ්වවිද්‍යාලයක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්/<br>ශ්‍රී ලංකා පරිපාලන සේවය හා සමාන්තර දීප ව්‍යාප්ත සේවාවල I වන ශ්‍රේණියේ නිලධාරීන්/<br>ජාතික අධ්‍යාපන ආයතනය හා ඊට සමාන්තර අධ්‍යාපන ආයතනවල අධ්‍යක්ෂ හෝ ඊට ඉහල තනතුරු දරන්නන්/<br>ගුරු අධ්‍යාපනඥ සේවයේ I වන පන්තියේ නිලධාරීන් | රු.1000/- |
| 03. | පිළිගත් විශ්වවිද්‍යාලයක කථිකාචාර්යවරුන්/<br>ශ්‍රී ලංකා පරිපාලන සේවය හා ඊට සමාන්තර දීප ව්‍යාප්ත සේවාවල II වන පන්තියේ නිලධාරීන්/<br>ජාතික අධ්‍යාපන ආයතනය හා ඊට සමාන්තර අධ්‍යාපන ආයතනවල ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්/<br>ගුරු අධ්‍යාපනඥ සේවයේ II වන පන්තියේ නිලධාරීන් | රු.900/- |
| 04. | පිළිගත් විශ්වවිද්‍යාලයක ආධුනික කථිකාචාර්යවරුන්/<br>ශ්‍රී ලංකා පරිපාලන සේවය හා සමාන්තර දීප ව්‍යාප්ත සේවාවල III වන පන්තියේ නිලධාරීන්/<br>ජාතික අධ්‍යාපන ආයතනය හා ඊට සමාන්තර අධ්‍යාපන ආයතනවල කථිකාචාර්යවරුන්/<br>ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන පන්තියේ නිලධාරීන් | රු.800/- |
| 05. | ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I/ II/ III ශ්‍රේණිවල නිලධාරීන්/<br>ශ්‍රී ලංකා ගුරු සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන්/<br>ගුරු උපදේශකවරුන්/ උපාධිධාරීන් | රු.700/- |
| 06. | අනෙකුත් සුදුසුකම් සහිත දේශකයන් සඳහා | රු.600/- |

(01 - I)

...දි :

I. එක් සම්පත්දායකයෙකු දිනකට පැය 03ක උපරිම දේශන කාලයකට සීමා විය යුතුය.

II. විශ්‍රාමික නිලධරයන් සඳහා දිනකට උපරිම දේශන කාලය පැය 06කි.

III. එසේම එම පුහුණු වැඩසටහන් සඳහා සම්පත්දායකයින් ලෙස අභ්‍යන්තර නිලධාරීන් සහභාගීවන්නේ නම් හා ඔවුන් තම නිත්‍ය රාජකාරි වේලාවට අමතරව එම කටයුතුවල නිරත වී ඇත්නම් පමණක් එම කාලය සඳහා ඉහත දීමනා ගෙවීමට කටයුතු කළ යුතු වේ.

IV. දේශන සඳහා බාහිර නිලධරයන් යොදා ගැනීමේ දී අදාළ ආයතන ප්‍රධානියාගේ අවසරය මත ඔහුගේ සාමාන්‍ය රාජකාරිවලට බාධාවක් නොවන ලෙස යොදා ගත යුතුය.

V. මෙම කාර්යය සඳහා වෙනත් කිසිදු දීමනාවක් නොගෙවිය යුතුය.

VI. එමෙන්ම පවතින ප්‍රතිපාදන කළමනාකරණය කර ගත යුතු අතර, භාණ්ඩාගාරයෙන් අමතර ප්‍රතිපාදන නොඉල්ලිය යුතුය.

3. සම්පත්දායකයින් සඳහා ගාස්තු සංශෝධනය සම්බන්ධයෙන් වන මගේ සමාංක හා 2018.03.16 ... 2019.01.01 දිනැති ලිපි මෙයින් අවලංගු වේ.

4. තව ද ඉහත 2019.01.25 දිනැති ලිපියේ සඳහන් කරුණු ඉදිරි සංශෝධනයක දී සැලකිල්ලට ගන්නා ... කාරුණිකව දන්වා සිටිමි.

...න්දන කුමාරසිංහ
...යතන අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)

...පිටපත් : 1. විගණකාධිපති

2. ලේකම්
ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව - ඔබගේ අංක NSCC/06/30/AL-II හා 2018.07.09 දිනැති ලිපිය අනුව දැ.ගැ.ස.

(01 - II)

රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
பொது நிருவாக, அனர்த்த முகாமைத்துவ மற்றும் கால்நடை அபிவிருத்தி அமைச்சு
**Ministry of Public Administration, Disaster Management and Livestock Development**

ආයතන අංශය
தாபனப் பிரிவு
**Establishments Division**


නිදහස් චතුරශ්‍රය, කොළඹ 07. சுதந்திர சதுக்கம், கொழும்பு 07. Independence Square, Colombo 07.

| දුරකථන / தொலைபேசி / Telephone | ෆැක්ස් / பெக்ஸ் / Fax | ඊ-මේල් / ஈ-மெயில் / E-mail | වෙබ් අඩවිය / இணையத்தளம் / Website |
|---|---|---|---|
| 011-2696211-13 | 011-2692158 | dge@pubad.gov.lk | www.pubad.gov.lk |


| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| EST/7/ALLOW/05/0107 | HA/05/03/02/01 | 2019.10.24 |

ලේකම්
අභ්‍යන්තර, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

**පුහුණු වැඩසටහන්වල සම්පත්දායක දීමනා ගෙවීම සම්බන්ධවයි**

ඔබගේ සමාංක හා 2019.09.10 දිනැති ලිපිය හා සම්බන්ධ වේ.

02. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය ද සැලකිල්ලට ගෙන, නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වන දිනක දේශනයක් සිදු කරනු ලබන නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් පිටත බාහිර සම්පත්දායකයින් සඳහා පමණක් මගේ සමාංක හා 2019.03.07 දිනැති ලිපියෙන් අනුමත දීමනා, නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ සුදුසුකම් ලත් දේශකයින් සොයා ගැනීමේ අපහසුතාව ද සැලකිල්ලට ගෙන එම කාර්යය වෙනුවෙන් වෙනත් කිසිදු දීමනාවක් නොගෙවීමේ පදනම මත දිනකට පැය 06ක උපරිමයකට යටත්ව ගෙවීම අනුමත කරමි.

03. තව ද මගේ සමාංක හා 2019.03.07 දිනැති ලිපියෙහි සඳහන්, මෙම ලිපියෙන් සංශෝධිත I කොන්දේසිය හැර අනෙක් කොන්දේසි එපරිදිම අදාල වන බව කාරුණිකව දන්වා සිටිමි.

වන්දන කුමාරසිංහ
ආයතන අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 1. විගණකාධිපති

2. ලේකම්
ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා
කොමිෂන් සභාව - ඔබගේ අංක NSCC/06/30/AL-II හා 2018.07.09 දිනැති ලිපිය අනුව දැ.ගැ.ස.

3. දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
නුවරඑළිය - ඔබගේ අංක GA NE/TR & RE/HA/T-1 හා 2019.07.03 දිනැති ලිපිය අනුව අ.ක.ස.

පාලන
05 NOV 2019

27